සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

**දෙවන වාර ඇගයීම - 2016**
**இரண்டாம் தவணைமதிப்பீடு - 2016**
**Second Term Evaluation - 2016**

| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | බුද්ධ ධර්මය I පත්‍රය<br>புத்த சமயம் வினாத்தாள்-I<br>Buddhism I Paper | පැය එකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>One Hour |
|---|---|---|

*__සැලකිය යුතුයි:__*

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**

01. වෙනත් කිසිඳු උපතක නොදකින බෝසත් උපතේ පමණක් දක්නට ලැබෙන ආශ්චර්යවත් සිදුවීම් පෙළකින් එකක් වන්නේ,
 1. සිංහනාද පැවැත්වීමය. 2. මහ වැසි වැසීමය. 3. මව මිය යාමය. 4. යස ඉසුරු ලැබීමය.

02. කම් සැපයෙන් තික්මී සැහැල්ලු වූ පැවිදි ජීවිතයට ඇතුළු වීමෙන් සාංසාරික අභියෝග ජයගත හැකිබව සිදුහත් කුමරුට අවබෝධ වූයේ,
 1. රාහුල කුමරු ඉපදීම නිසාය. 2. සතර පෙරනිමිති දැකීම නිසාය.
 3. කාමභෝගී ජීවිතය නිසාය. 4. නළඟනන්ගේ රැඟුම් නිසාය.

03. කුසල් සිත හා එක්වූ විදර්ශනා ඥානය බුදු දහමේ හැඳින්වෙන්නේ,
 1. සමාධිය ලෙසය. 2. ශීලය ලෙසය. 3. ප්‍රඥාව ලෙසය. 4. සමථය ලෙසය.

04. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය" මෙම අභීත ප්‍රකාශය සිදුකළ රජතුමා වන්නේ,
 1. දේවානම්පියතිස්ස රජතුමාය. 2. දුටුගැමුණු රජතුමාය.
 3. මහසෙන් රජතුමාය. 4. සද්ධාතිස්ස රජතුමාය.

05. බුදු දහමට අනුව "සතිමතෝ" යනුවෙන් හැඳින්වෙන්නේ,
 1. උත්සාහවත්ව කටයුතු කිරීමය.
 2. පිරිසිදුව කටයුතු කිරීමය.
 3. හරි වැරදි දැක සිහියෙන් කටයුතු කිරීමය.
 4. අනලස්ව කටයුතු කිරීමය.

06. සිතට පව් සිතිවිලි ඇතුළු වීමට ඉඩ නොදී කුසල් සිතිවිලි වර්ධනය කිරීම සඳහා පුරුදු පුහුණු කළ යුත්තේ,
 1. සිල් රැකීමයි. 2. භාවනාවයි. 3. ඉන්ද්‍රිය සංවරයයි. 4. සති සම්පජඤ්ඤයයි.

07. පහන් සිල තුපන්නේ නම් ආලෝකයද නුපදී. පහන නිවුන විට ආලෝකයද නැතිවී යයි. මෙම සියලු සිදුවීම් ක්‍රියාත්මක වන ධර්මතාවය බුදු දහම අනුව හැඳින්වෙන්නේ,
 1. කර්මය යනුවෙනි. 2. ශීලය යනුවෙනි.
 3. භාවනාව යනුවෙනි. 4. පටිච්ච සමුප්පාදය යනුවෙනි.

08. යේ ධම්මා හේතුප්පභවා... යන ගාථාව අස්සජි මහරහතන් වහන්සේ දේශනා කළේ,
 1. උපතිස්ස පිරිවැජියාටය. 2. කෝලිත පිරිවැජියාටය.
 3. තුන්බෑ ජටිලයන්ටය. 4. නිගණ්ඨනාථපුත්ත තුමාටය.

09. බුදුරජාණන් වහන්සේ වදාළ කවර දේශනාවක් වුවද චතුරාර්ය සත්‍යයෙන් එකකට ඇතුළත් කළ හැකිය. මෙම මූලික ඉගැන්වීම බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
 1. දම්සක් පැවතුම් සූත්‍ර දේශනයේදීය. 2. ආදිත්ත පරියාය සූත්‍ර දේශනයේදීය.
 3. මහා මංගල සූත්‍ර දේශනයේදීය. 4. පරාභව සූත්‍ර දේශනයේදීය.

10. බුද්ධකාලීන භාරතයෙහි ප්‍රධාන වශයෙන් පිළිගත් විමුක්තිගාමී පටිපදාවන් දෙකෙන් එකක් වන්නේ,
1. මැදුම් පිළිවෙතයි.
2. කාමසුඛල්ලිකානුයෝගයයි.
3. චතුරාර්ය සත්‍යයයි.
4. සතිපට්ඨාන වැඩීමයි.

11. බුදු දහමට අනුව පංචස්කන්ධය සිතින් දැඩිව අල්ලා ගැනීම හැඳින්වෙන්නේ,
1. සංඛාරා ලෙසය.
2. උපාදාන ලෙසය.
3. තෘෂ්ණාව ලෙසය.
4. සඤ්ඤා ලෙසය.

12. චුන්ද සූකරිකයා මරණාසන්න මොහොතේ ඌරකු මෙන් කෑගසමින් දැඩි වේදනාවෙන් දඟලුවේය. ඔහුට විපාක දුන් කර්මය වන්නේ,
1. කටත්තා කර්මය වේ.
2. ගරුක කර්මය වේ.
3. ජනක කර්මය වේ.
4. දිට්ඨධම්මවේදනීය කර්මය වේ.

13. කර්මයේ බලපෑම් කෙතරම් තීරණාත්මක වුවද යහපත් කර්ම විපාක මතුකර ගැනීමටද, ලැබෙන අකුසල විපාක වෙනස් කරගැනීමටද උපකාර වන කරුණු හතරක් බුදු දහමේ පෙන්වා දේ. ඉන් එකක් වන්නේ,
1. කාල සම්පත්තියයි.
2. ගති විපත්තියයි.
3. දිට්ඨධම්ම වේදනීය විපාක ලැබීමයි.
4. කර්ම විපාකයට නොබියව මුහුණදීමයි.

14. සිදුහත් කුමරුට සුදුසු කුමරියක සරණ පාවා දීමට පියරජතුමා කටයුතු කළේ කුමරු,
1. විසිවයස් ලැබූ පසුවය.
2. සොළොස් වයස් ලැබූ පසුවය.
3. විසිනව වන වයස් ලැබූ පසුවය.
4. දහඅට වයස් ලැබූ පසුවය.

15. ඉඳුරන් පිනවමින් අතෘප්තිකරව කම්සැප සොයා යන අය අද මෙන්ම බුද්ධ කාලීන සමාජයේද බොහෝ වූහ. එහෙත් ඔවුනට නොපෙනෙන පැත්තක් බෝසතාණන් වහන්සේට පෙනිණ. එයනම්,
1. සියලු සැප සම්පත් ස්ථිර බවය.
2. සියලු සැප සම්පත් තාවකාලික බවය.
3. සැප සම්පත් තුළින් සදාකාලික සුවයක් ලැබෙන බවය.
4. සැප සම්පත් මානසික සුවයට අවශ්‍ය බවය.

16. බුදුරජාණන් වහන්සේ සුන්දර වූ නිර්වාණයට සැපත් වූ බැවින්,
1. අරහං නම් වන සේක.
2. සුගත නම් වන සේක.
3. විජ්ජාචරණ නම් වන සේක.
4. ලෝකවිදූ නම් වන සේක.

17. සුනිමල්ගේ පියා ඌරන් මරා මස් විකුණන වෙළෙන්දෙකි. ඔහු විසින් සිදුකරනු ලබන්නේ,
1. කයින් කරන අකුසලයකි.
2. වචනයෙන් කරන අකුසලයකි.
3. කය වචන දෙකින් කරන අකුසලයකි.
4. මනසින් සිදුකරනු ලබන අකුසලයකි.

18. තිවන් දක්නා ජාති දක්වා කිසියම් භවයකදී විපාක ලබාදීමට සමත් කර්මය වන්නේ,
1. දිට්ඨධම්මවේදනීය කර්මයයි.
2. අහෝසි කර්මයයි.
3. ගරුක කර්මයයි.
4. අපරාපරියවේදනීය කර්මයයි.

19. බුදු දහමට අනුව ලෝකය ලෙස හැඳින්වූයේ,
1. රූපයටය.
2. පඤ්චස්කන්ධයටය.
3. සංඛාරයටය.
4. වේදනාවටය.

20. බුදු දහමේ ඉගැන්වෙන අටලෝ දහමට අයත් නොවන්නේ,
1. ලාභ
2. දුක
3. සැප
4. මෛත්‍රිය

21. රූපස්කන්ධයෙහි ඇතුළත් පංචවිධ වූ රූප අතරින් පැහැදිලිව පෙනෙන්නේ,
1. කයයි 2. වේදනාවයි. 3. තණ්හාවයි. 4. චේතනාවයි.

22. "ගෞතමයන් වහන්ස, ඇතුළතත් අවුල්ය, පිටත ද අවුල්ය. සත්ව ප්‍රජාව අවුලෙන් වෙළී සිටියි. කවරෙක් නම් මේ අවුල නිරවුල් කරන්නේද ?" මෙසේ බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න කළේ,
1. දෙවි කෙනෙක් 2. බමුණෙක් 3. ගිහියෙක් 4. පැවිද්දෙක්

23. බුදු දහමට අනුව සසර දුකින් එතෙර විය හැකි ත්‍රිශික්ෂාවේ පළමු පියවර වන්නේ,
1. ප්‍රඥාවයි. 2. සීලයයි. 3. සමාධියයි. 4. විදර්ශනාවයි.

24. බුදුරජාණන් වහන්සේගේ ජීවිතය පියුමක් හා සමාන කර ඇත්තේ,
1. පියුම පවිත්‍රව ඇති නිසාය.
2. පියුම ඇත්තේ මඩ සහිත දියේ නිසාය.
3. පියුමක් මෙන් උන්වහන්සේ සමාජය හා නොබැඳී නොඇලී වෙසෙන නිසාය.
4. පියුම සුවඳ ඇති නිසාය.

25. වැලිවිට අසරණ සරණ සිරිසරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ ගිහිකළ නම වූයේ,
1. කුලතුංග බන්ඩාය. 2. සෙනරත් බන්ඩාය.
3. රත්බන්ඩාය. 4. වීරතුංග බන්ඩාය.

26. දහඅටවන සියවසේ මැද භාගය වනවිට දේශීය බෞද්ධ සංස්කෘතිය පරිහානියට පත්වූයේ,
1. ඉංග්‍රීසීන් නිසාය.
2. ලන්දේසීන් නිසාය.
3. නායක්කර් වංශික රජවරුන් නිසාය.
4. පෘතුගීසි පාලනය නිසාය.

27. ඉතා දුගී පවුලක උපත ලැබුවද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට රමණීට අවස්ථාව උදාවිය. බුදු දහමට අනුව ඇය සැපතට පත්වූයේ,
1. ගති සම්පත්තිය නිසාය.
2. ප්‍රයෝග සම්පත්තිය නිසාය.
3. උපාය සම්පත්තිය නිසාය.
4. කාල සම්පත්තිය නිසාය.

28. බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ,
1. යසකුල පුත්‍රයාටය. 2. මිගාර සිටුවරයාටය.
3. අනේපිඬු සිටුවරයාටය. 4. සිගාලක ගෘහපතියාටය.

29. බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වෙන්නේ,
1. පූජාවලියයි. 2. ජාතක කථා පොතයි.
3. ධම්මපදයයි. 4. සසදාවතයි.

30. කර්මය හා විපාක පෙන්වා දෙන බෞද්ධ සූත්‍රයක් වන්නේ,
1. මංගල සූත්‍රයයි.
2. චූල්ලකම්ම විභංග සූත්‍රයයි.
3. කරණීයමෙත්ත සූත්‍රයයි.
4. දම්සක් පැවතුම් සූත්‍රයයි.

31. සමථ භාවනාව හඳුන්වනු ලබන වෙනත් නමක් වන්නේ,
1. ප්‍රඥා භාවනාව 2. ත්‍රිලක්ෂණ භාවනාව
3. සමාධි භාවනාව 4. විදර්ශනා භාවනාව

32. ප්‍රසිද්ධියේ එක් ජීවිතයකුත් අප්‍රසිද්ධියේ තවත් ජීවිතයකුත් ගත නොකළ, භාරතයේ සිටි, ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයකු වන්නේ,
1. මක්ඛලිගෝසාල තුමාය.
2. බුදුරජාණන් වහන්සේය.
3. නිගණ්ඨනාථපුත්ත තුමාය.
4. පකුධකච්චායන තුමාය.

33. රන් කාසියක් රන්කරුවකු අතට පත්වූ විට ඔහු එය පරීක්ෂා කරයි. බර, වර්ගය ආදිය තක්සේරු කරයි. නිවැරදි වටිනාකම තේරුම් ගනී. බුදු දහමට අනුව මෙය හැඳින්විය හැක්කේ,
1. සඤ්ඤාව ලෙසය.
2. විඤ්ඤාණය ලෙසය.
3. පඤ්ඤා ලෙසය.
4. රූප ලෙසය.

34. ගැටෙන සුළු බව, වෛරය, කෝපය ආදී අකුසල් බුදු දහමේ හැඳින්වෙන්නේ,
1. ලෝභ චේතනා නමිනි.
2. මෝහ චේතනා නමිනි.
3. ද්වේෂ චේතනා නමිනි.
4. අමෝහ චේතනා නමිනි.

35. සටනේදී මියගිය එළාර රජුට රාජකීය ගෞරවය දී ආදාහනය කොට, සෑයක් තනවා නිශ්ශබ්දතාවය දක්වා එයට ගරු කරන ලෙස මහජනතාවගෙන් ඉල්ලීමක් කළ රජතුමා වූයේ,
1. දුටුගැමුණු රජතුමාය.
2. මහසෙන් රජතුමාය.
3. වළගම්බා රජතුමාය.
4. දෙවනපෑතිස් රජතුමාය.

36. මුණිගුණාලංකාරය නම් ශාස්ත්‍රීය ග්‍රන්ථය රචනා කළේ,
1. තොටගමුවේ රාහුල සංඝරාජ හිමිය.
2. වැලිවිට සිරි සරණංකර සංඝරාජ හිමිය.
3. විදාගම මහා මෛත්‍රිය හිමිය.
4. කැරගල වනරතන සංඝරාජ හිමිය.

37. සිදුහත් කුමරුගේ මුල්ම ගුරුවරයා වූයේ,
1. භාර්ගව තවුසාණන්ය.
2. සර්වමිත්‍ර බමුණාය.
3. අසිත තවුසාණන්ය.
4. ආලාරකාලාම තවුසාණන්ය.

38. "බඹරා මල නොතලා රොන් ගන්නා සේ" මෙම උපමාව වඩාත් ගැලපෙන්නේ ස්වාමීන් වහන්සේලාගේ,
1. සමාජ සේවයටය.
2. ධර්මය දේශනා කිරීමේ විලාසයටය.
3. ප්‍රත්‍ය පහසුකම් ලබාගැනීමටය.
4. ශාසනික සේවයටය.

39. සිදුහත් කුමරුට කොතෙක් රාජ්‍ය සම්පත් තිබුණද, ඒවායින් උදම් නොවී විමසුම් නුවණින් යුතුව කටයුතු කිරීමෙන් පැහැදිලි වන්නේ,
1. මව්පියන්ට කීකරුවීමය.
2. ගුරුවරුන්ට කීකරුවීමය.
3. ඥාතීන්ගේ සිත් දිනාගැනීමය.
4. තරුණ ජීවිතයේ අභියෝග ජය ගැනීමය.

40. ගැමි ජනතාව සාමකාමී දැහැමි දිවි පැවැත්මකට යොමු කිරීමට නායකත්වය ගෙන කටයුතු කරන්නේ,
1. ස්වේච්ඡා ආයතනයයි.
2. පොලීසියයි.
3. පල්ලියයි.
4. ගමේ පංසලේ නායක ස්වාමීන්වහන්සේ ය.

(05)

1. බුදු දහමේ සීලය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද ?
2. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස තුනක් ලියන්න.
3. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගැනීම සඳහා සීලයෙන් ලැබෙන පිටුවහල කවරේද ?

(06) දෙමව්පියන් හා දරුවන් අතර යහපත් සබඳතාවක් පවත්වා ගැනීම දෙපාර්ශවයේ ම හිතසුව පිණිස හේතු වේ. දරුවකුට නිවසේදී මුණගැසෙන දෙවිවරු මව්පියෝ යි. දෙමව්පියන් සතර බ්‍රහ්ම විහරණවලින් යුක්ත බව බුදු දහමේ උගන්වයි.

1. සතර බ්‍රහ්ම විහරණවලින් දෙකක් නම් කරන්න.
2. සිගාලෝවාද සූත්‍රයට අනුව දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න.
3. යුතුකම් නිසිලෙස ඉටු කිරීම තුළින් යහපත් සමාජයක් ගොඩනගා ගත හැකි බව සිගාලෝවාද සූත්‍රයේ සමාජ කණ්ඩායම් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(07) ජාතික ආගමික සහජීවනය බුදු දහම කිසිසේත්ම බැහැර නොකරයි. මිනිසුන් වශයෙන් අප සියලුදෙනාම එකට ජීවත් විය යුතුය.

1. බහුජාතික බහු ආගමික සමාජයක් තුළ සහජීවනයෙන් කටයුතු කිරීමට මගපෙන්වන බෞද්ධ ඉගැන්වීම් දෙකක් ලියන්න.
2. තමා උපමා කොට අනුන් ගැන සිතීමෙන් සිදුවන යහපත කවරේද ?
3. ශිෂ්‍යයන් වශයෙන් පොදු දේපළ සුරක්ෂිත කරගැනීමෙන් සිදුවන සමාජ යහපත කවරේද ?

(08) බුදුවරයකු ලොව පහළ වන්නේ උත්තරීතර පරම සත්‍ය මිනිසාට දේශනා කිරීමටය.

1. චතුරාර්ය සත්‍ය ධර්ම අතුරින් දෙකක් ලියන්න.
2. සසර දුක තුන් ආකාර වේ. එය නම් කරන්න.
3. අප මුහුණ දෙන සමාජගත ගැටළු විසඳා ගැනීම සඳහා ආර්ය සත්‍ය ආකෘතිය උපයෝගී කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

The National e-learning Portal for The General Education